# ~හරි හොඳ මුවා~



Tharushi Thurunuwara

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නව්කරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

# පිදුම

මුල් අකුරු කර
මාගේ නැණනුවණ පෑදූ
ආදරණීය ගුරුතුමිය
වෙත හරසරින් පුදමි.

o

# ස්තුතිය

මාගේ මුල්ම ගුරුවරිය
වූ අම්මා වෙත

o



# එක්තරා කැලෑවක මුවෙක් වාසය කලා.

මේ මුවා හරිම
හොඳයි.
දවසක් මේ මුවා
දැක්කා හාවෙක්
පිටිපස්සෙන්
කොටියෙක්
පන්නනවා.

ඒය දැකපු මුවා
නපුරු
කොටියගෙන්
හාවාව
බේරගන්න
විදිහක් හිතුවා.

ඒයා කොටියගෙ අවධානය වෙනස් කරන්න සිතා උපායක් යෙදුවා. වෙනත් දිශාවකින් සද්ද කර සැඟවුණා.

කොට් රාළ
නැවතිලා සද්දය
ඇසුන දෙසට
හැරුණා.හාවා
පණ
බේරාගත්තා.

හරි හොඳ මුවා
ගත්ත උත්සාහය
සාර්ථක වුණා.
හරි හොඳ මුවාට
හරිම සතුටුයි.

ආයෙත් දවසක
වලහෙක්
අසනීප වෙලා
තිබුණා.



ඉතින් ඒ මුවා
වලහව බලන්න
ගියා.ඉතින් මුවා
ඒ වලහට සනීප
වෙන්න උදව්
කළා. දැන් ඉතින්
වලහට සනීපයි.

වලහා හරි හොඳ මුවාට ගොඩක් ස්තුති කරා. හරි හොඳ මුවාටත් හරිම සතුටුයි.

මෙහෙම කල්
ගත වුණා.
නපුරු සත්තු
පවා හරි හොඳ
මුවාට කරදර
කරන එක අඩු
වුණා.

දිනක්
තණකොළ කකා
හිටපු ගව
රංචුවක් මැද්දට
කොටිරාළ
කෙනෙක්
පැන්නා.

බියට පත් වුණ
ගව රංචුව
අංවලින් කොටි
රාළට හොඳටම
අනින්න ගත්තා.

කොට්රාල පණා
බේරාගෙන
දිවුවා. ඒත්
කොට්රාලට
හොඳටම තුවාල
වෙලා තිබ්බේ.

කොට්රාල
වේදනාවෙන්
බිම වැතිරුණා.
කෙඳිරි ගාමින්
සිටි කොට්රාල
දෙස කවුරුත්
බැලුවෙ නෑ.

එතනින් යන්න ගිය හැම සතෙක්ම කොටි රාළට බයේ දිවුවා.

හරි හොඳ මුවාද එතනින් යන්නට ආවා. කෙඳිරි ගාන සද්දය ඇසී ඒ දෙසට ගොස් බැලුවා.

වේදනාවෙන් හිටිය කොටිරාළව දැක්කා.



ඒත් මුවා බයේ
දිව්වේ නෑ. එයා
කොටියා දෙස
හොඳින් බැලුවා.
තුවාල වලින් ලේ
ගලනවා දැක්කා.

හරි හොඳ මුවාට
කොට්ටියා ගැන
දුක හිතුණා. එයා
තුවාල වලට
බෙහෙත් දැම්මා.

කොට් රාළට
සුවයක් දැනුණා.
කොට් රාල
ස්තුතියි කියන්න
වගේ මුවා දෙස
බැලුවා.

මේ මුවා මේ
විදියට කරදරේ
හිටිය සතුන්ට
උදව් කරා.ඊට
පස්සේ නම්
නපුරු සත්තු
වුණාත් මේ
මුවාට කරදර
කරේ නෑ.

ඉතිං ඔක්කොම
සත්තු මේ මුවාට
නම දැම්මා හරි
හොඳ මුවා
කියලා.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01